Fair Use in Copyright Law, Plagiarism, and the Role of Libraries

Senevirathna, R.A.P.S.

Pannila, U.A.L.

Abstract

Copyright law is a common legal framework in force in every country. It provides legal protection to works that are the result of intellectual activity. This study aims to examine the legal basis of fair use under copyright law within the Intellectual Property Act and identify the circumstances in which such use is permitted for academic purposes. The study was conducted using a qualitative analytical approach based on secondary sources. Accordingly, the country's copyright law is set out in the Intellectual Property Act No. 36 of 2003, and protection is provided under this law to original intellectual creations, including academic, artistic, and scientific works within the educational, artistic, and scientific range. In addition, derivative works are also protected. The Act also specifies certain works that are not protected, as well as cases where economic rights and moral rights apply. The Act further provides that fair use may be used for personal use, teaching in educational institutions, study and research activities, reporting on current events, and use in libraries and archives. However, despite the permission for fair use, some people still engage in creative piracy. Nowadays, due to the development of modern technology, the expansion of opportunities for copying, and the abundance of new devices for storing and exchanging various creations, it can be seen that the limits given for fair use are being exceeded and misused. In particular, by helping library readers better understand the uses of intellectual creations and raising public awareness, the misuse of creations can be prevented to some extent.

Keywords: Copyright Law, Fair Use, Intellectual Property, Library Resources, Plagiarism

ප්‍රකාශන හිමිකම් නීතියෙහි සාධාරණ භාවිතය, නිර්මාණ කොල්ලය හා පුස්තකාලයවල කාර්යභාරය

සංක්ෂේපය

ප්‍රකාශන හිමිකම් නීතිය සෑම රටකම ක්‍රියාත්මකව ඇති පොදු නීතියකි. බුද්ධිය මෙහෙයවා සිදු කරන ක්‍රියාවල ප්‍රතිඵලයක් වශයෙන් බිහිවන නිර්මාණවලට නෛතික ආරක්ෂාව ලබාදීම ප්‍රකාශන හිමිකම් නීතියෙන් සිදු කෙරේ. බුද්ධිමය දේපළ පනතේ ප්‍රකාශන හිමිකම් නීතියෙහි සාධාරණ භාවිතය, නීතිමය පදනම පිළිබඳ හා ශාස්ත්‍රීය කටයුතු සඳහා ඉඩ දී ඇති අවස්ථා පිළිබඳ විමසා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. ද්විතියික මූලාශ්‍රයමත පදනම්ව ගුණාත්මක විශ්ලේෂණාත්මක ක්‍රමවේදය භාවිතයෙන් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. මෙරට ප්‍රකාශන අයිතිය පිළිබඳ නීතිය 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතින් තහවුරු කර ඇත. මෙම නීතියෙන් ආරක්ෂාව සලසනු ලබන්නේ ශාස්ත්‍රීය, කලා හා විද්‍යාත්මක පරාසයකට අයත් මුල් බුද්ධිමය නිර්මාණවලට සහ ශාස්ත්‍රීය, කලාත්මක හා විද්‍යාත්මක කෘතිවලටය. එපමණක් නොව, ව්‍යුත්පන්න කෘති සේ සැලකෙන නිර්මාණද ආරක්ෂා කරනු ලැබේ. ආරක්ෂාව නොලැබෙන කෘති මෙන්ම ආර්ථික අයිතිවාසිකම හා සදාචාරාත්මක අයිතිවාසිකම හිමිවන අවස්ථාද මෙම පනතින් පෙන්වා දී ඇත. ප්‍රකාශන හිමිකම් නීතිය තුළ සාධාරණව භාවිත කළ හැකි අවස්ථා ලෙස පෞද්ගලික භාවිතය සඳහා, අධ්‍යාපන ආයතනවල ඉගැන්වීමේ කටයුතු සඳහා, අධ්‍යයන හා පර්යේෂණ කටයුතු සඳහා, කාලීන සිදුවීම් වාර්තාකරණයේදී පුස්තකාලයවල හා ලේඛනාගාරවල භාවිතය සඳහා යන අවස්ථා පෙන්වා දී ඇත. ඉහත කී ආකාරයේ සාධාරණ භාවිතයට අවසර ලබා දී තිබියදීත් ඇතැම් පුද්ගලයන් නිර්මාණ කොල්ලයේ යෙදෙන අවස්ථා පිළිබඳව මෙම අධ්‍යයනයෙන් හඳුනාගත හැකි විය. වර්තමානයේ නවීන තාක්ෂණයේ වර්ධනය, පිටපත්කරණය සඳහා ඇති අවස්ථා පුළුල් වීම, විවිධ නිර්මාණ ගබඩා කිරීම, හුවමාරු කිරීම සඳහා නව උපකරණ හා උපාංග බහුල වීම වැනි හේතූන් නිසා සාධාරණ භාවිතය සඳහා දී ඇති සීමාවෙන් ඔබ්බට ගොස් අනිසි ලෙස භාවිතය සිදුවන බව තහවුරු විය. විශේෂයෙන්ම පුස්තකාලයීය පාඨකයන් සඳහා බුද්ධිමය නිර්මාණ භාවිතය පිළිබඳ නිසි අවබෝධයක් ලබා දීම හා සාමාන්‍ය ජනතාවට ඒ පිළිබඳ දැනුවත්භාවයක් ලබාදීමෙන් යම්තාක් දුරට නිර්මාණ අවභාවිතයෙන් මුදාගත හැකි බව යෝජනා කළ හැකිය.

ප්‍රමුඛ පද- බුද්ධිමය දේපළ, නිර්මාණ කොල්ලය, ප්‍රකාශන හිමිකම් නීතිය, පුස්තකාලයීය සම්පත්, සාධාරණ භාවිතය

1.හැඳින්වීම

මිනිසාගේ බුද්ධිමය ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් ලෙස තොරතුරු බිහි වේ. වර්තමාන දැනුම් සමාජය තුළ තොරතුරුවලට විශාල ඉල්ලුමක් පවතී. අධ්‍යාපන හා පර්යේෂණ ක්ෂේත්‍රය, ආර්ථික හා දේශපාලනික ක්ෂේත්‍රය, සමාජීය හා සංස්කෘතිකමය ක්ෂේත්‍රය වැනි ක්ෂේත්‍ර ඔස්සේ බිහිවන එම තොරතුරු ප්‍රයෝජනයට ගත හැකි ලෙස විවිධ මාධ්‍යවලින් හා විවිධ ස්වරූපයෙන් ප්‍රකාශයට පත් වේ. ඒවා මුද්‍රිත හෝ මුද්‍රිත නොවන ආකාරයෙන් දැක ගත හැකිය. මිනිසාගේ සිතෙහි ඇතිවන අදහස්, සංකල්ප, නිර්මාණ, සොයාගැනීම් ඔස්සේ බිහිවන බුද්ධිමය නිර්මාණ හා බුද්ධිමය දේපළවලට සුවිශේෂ වැදගත්කමක් හිමිවනු ඇත.

විවිධ වර්ගයේ දේපළ හඳුනාගැනීම, වර්ග කිරීම හා එහි අයිතිවාසිකම් පිළිබඳව ඇත අතීතයේ සිටම මිනිසාගේ අවධානයට යොමු වී තිබුණි. පුද්ගලයකු සතු දේපළ ඉපැරණි රෝම නීතියෙහි දෙආකාරයකින් පෙන්වා දී ඇත. ඒවා නම් චංචල හා නිශ්චල දේපළ වශයෙනි. මෙමඟින් දක්වා ඇත්තේ ද්‍රව්‍යමය වශයෙන් හඳුනාගත හැකි ස්වභාවයේ දේපළ පමණි. දේපළ නීතිය පිළිබඳ විග්‍රහාත්මක ආකාරයෙන් විශ්ලේෂණය කරන රෝම ලන්දේසි නීතියෙහි ද්‍රව්‍යමය මෙන්ම අද්‍රව්‍යමය ස්වභාවයේ දේපළ පිළිබඳවද දක්වා ඇත. ප්‍රකාශන අයිතිය, වෙළඳ ලකුණු, පේටන්ට් අයිතිවාසිකම් යනාදිය අද්‍රව්‍යමය චංචල දේපළ ලෙස හඳුන්වා දී ඇත. මේ අනුව බලන විට පුද්ගලයකු සතු වත්කම් ලෙස සැලකෙන දේපළ ප්‍රධාන වශයෙන් වර්ග තුනකි.

- නිශ්චල දේපළ
- චංචල දේපළ
- බුද්ධිමය දේපළ යනුවෙනි.

නිශ්චල දේපළ යනු ඉඩකඩම්, ගොඩනැගිලි හා භූමිය මත ස්ථිරව පිහිටි දේපළයි. එක් තැනකින් තවත් තැනකට ගෙන යා හැකි දේපළ චංචල දේපළ වේ. මිනිසාගේ ඥානය, අවබෝධය, කලා කුසලතාව භාවිත කර නිර්මාණය කරන දේ, සාදන දේ, ලියා පළ කරන දේ, ගායනයෙන්, වාදනයෙන්, ඇඳීමෙන්, ඇඹීමෙන් නිපදවන දේ බුද්ධිමය දේපළට අයත් වේ. කෙසේ වුවද බුද්ධිමය දේපළ සංකල්පයේ වර්ධනයට සාධක ගණනාවක් බලපා ඇති බව පෙන්වා දිය හැකිය.

- අධ්‍යාපනයට ඇති අවස්ථා විවෘත වීම
- පර්යේෂණ ක්ෂේත්‍ර පුළුල් වීම

- තොරතුරු බිහිවීමේ වේගය වර්ධනය
- ප්‍රකාශන සුලබවීම හා විවිධ මාදිලියෙන් වෙළඳපොළට පැමිණීම
- ගෝලීයකරණය
- ජාත්‍යන්තර වෙළඳාම
- ඩිජිටල් තාක්ෂණය
- සන්නිවේදනයේ පුළුල් බව
- තොරතුරු මූලාශ්‍රය ප්‍රතිනිෂ්පාදනය කිරීමේ හැකියාව හා කාර්යක්ෂමතාව

වැනි සාධක බලපා ඇති බව පෙන්වා දිය හැකිය. බුද්ධිමය දේපළ සංකල්පය පිළිබඳ වැඩි අවධානයක් යොමු වන්නේ මෙවැනි පසුබිමකය.

2. පර්යේෂණ ගැටලුව

ඩිජිටල් තොරතුරු මූලාශ්‍රය සහ නව තාක්ෂණික ප්‍රවණතා හමුවේ, ඉගෙනුම්, ඉගැන්වීම් හා පර්යේෂණ ක්‍රියාවලි සඳහා සාධාරණ භාවිතය (Fair use), සාධාරණ ගනුදෙනු කිරීම (Fair dealing) සහ නිර්මාණ කොල්ලය (Plagiarism) යන සංකල්ප ක්‍රියාත්මක වන ආකාරය, ඒවායේ නීතිමය පදනම සහ අන්‍යෝන්‍ය සම්බන්ධතාව කෙසේද? සාධාරණ භාවිතය සහ සාධාරණ ගනුදෙනු යන නීතිමය සංකල්පවල අර්ථ නිරූපණය සහ ඒවායේ ප්‍රායෝගික අදාළත්වය කුමක්ද? ශාස්ත්‍රීය හා පර්යේෂණ කටයුතුවලදී නිර්මාණ කොල්ලය වැළැක්වීම සඳහා අනුගමනය කළ යුතු ප්‍රමිති සහ සදාචාරාත්මක ප්‍රතිපාදන මොනවාද? ඩිජිටල් තාක්ෂණය සහ අන්තර්ජාල මූලාශ්‍ර භාවිතය ඉහළ යාම මෙම සංකල්පවල අර්ථකථනවලට සහ බුද්ධිමය දේපළ ආරක්ෂාවට බලපා ඇත්තේ කෙසේද? අධ්‍යාපනික හා පර්යේෂණ කටයුතුවල නිදහස ආරක්ෂා කර ගනිමින්, අනෙකුත් නිර්මාණකරුවන්ගේ ප්‍රකාශන හිමිකම් නිසි ලෙස සුරැකීමට ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද? ආදිය මෙම අධ්‍යයනයේ ගැටලු ලෙස පෙන්වා දිය හැකිය.

3. අධ්‍යයනයේ අරමුණු

ප්‍රධාන අරමුණ

ප්‍රකාශන හිමිකම් නීතිය යටතේ සාධාරණ භාවිතය සහ සාධාරණ ගනුදෙනු කිරීම යන සංකල්පවල නීතිමය පදනම, සීමා සහ ශාස්ත්‍රීය කටයුතු සඳහා ඒවායින් සැලසෙන අවස්ථා විමර්ශනය කිරීම.

සෙසු අරමුණු

ශාස්ත්‍රීය ඉගෙනුම්, ඉගැන්වීම් සහ පර්යේෂණ කටයුතු සඳහා සාධාරණ භාවිතය හා සාධාරණ ගනුදෙනු කිරීම යන සංකල්ප යටතේ පවතින නීතිමය අවස්ථා සහ සීමා විශ්ලේෂණය කිරීම.

සාධාරණ භාවිතය, සාධාරණ ගනුදෙනු කිරීම සහ නිර්මාණ කොල්ලය අතර පවතින වෙනස්කම් හා සම්බන්ධතා පැහැදිලි කරමින්, නිර්මාණ කොල්ලයෙන් වැළකී තොරතුරු මූලාශ්‍රය නිසි ලෙස භාවිත කිරීම සඳහා මාර්ගෝපදේශ ඉදිරිපත් කිරීම.

ඩිජිටල් තොරතුරු මූලාශ්‍රය භාවිතයේදී සාධාරණ භාවිතය හා සාධාරණ ගනුදෙනු කිරීම සම්බන්ධයෙන් මතුවන නීතිමය හා ප්‍රායෝගික ගැටලු විශ්ලේෂණය කිරීම.

4. පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සම්පූර්ණයෙන්ම ද්විතීයික දත්ත (Secondary Data) මත පදනම් වූ ලේඛනමය (Documentary) පර්යේෂණයක් ලෙස සිදු කරන ලදී. ඒ සඳහා ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ නීති, අදාළ ව්‍යවස්ථාපිත පනත් සහ නීතිමය ප්‍රතිපාදන පුස්තකාලය සම්පත් ආශ්‍රයෙන් පුළුල් ලෙස අධ්‍යයනය කරන ලදී. තවද, මෙම විෂය ක්ෂේත්‍රයට අදාළව ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් ප්‍රකාශයට පත් කරන ලද ශාස්ත්‍රීය ලිපි, ග්‍රන්ථ සහ පර්යේෂණ පත්‍රිකා ප්‍රධාන මූලාශ්‍රය ලෙස පරිශීලනය කෙරිණි. අදාළ මූලාශ්‍රයවලින් අනාවරණය කරගත් තොරතුරු විශ්ලේෂණය කිරීම සඳහා ගුණාත්මක විශ්ලේෂණ විධික්‍රමයක් (Qualitative Analytical Method) අනුගමනය කරන ලදී.

මෙම විශ්ලේෂණයේදී ප්‍රධාන වශයෙන් ප්‍රකාශන හිමිකම් නීතිය යටතේ එන සාධාරණ භාවිතය සහ සාධාරණ ගනුදෙනු කිරීම යන සංකල්පවල නීතිමය පදනම, ඒවායේ විෂය පථය සහ සීමාවන් විමසා බලන ලදී. එමෙන්ම, නීතිමය වශයෙන් අනුමත කර ඇති

මෙම සීමා කිරීම්, අධ්‍යයන හා වෘත්තීය කටයුතුවලදී සිදුවන නිර්මාණ කොල්ලය නම් අනීතික සංකල්පයෙන් වෙනස් වන ආකාරය පිළිබඳව ද මෙහිදී විශේෂ අවධානය යොමු කරමින් තොරතුරු සංස්ලේෂණය කර ගුණාත්මකව විශ්ලේෂණය කර ඇත.

5. සාහිත්‍ය විමර්ශනය

බුද්ධිමය දේපළ සංකල්පය හැඳින්වීම

බුද්ධිමය දේපළ යනුවෙන් අදහස් කරනුයේ ආර්ථික, විද්‍යාත්මක, කාර්මික, සාහිත්‍ය හා කලා යන ක්ෂේත්‍රවල බුද්ධිය මෙහෙයවා සිදු කරන ක්‍රියාවල ප්‍රතිඵලයක් වශයෙන් බිහිවන නිර්මාණවලට නෛතික ආරක්ෂාව ලබාදීමයි. සමාජ, ආර්ථික, සංස්කෘතික සංවර්ධනය උදෙසා බිහිවන නිර්මාණවල නෛතික ආරක්ෂාව ලබාදීම වෙනුවෙන් ලොව බොහෝ රටවල මෙම සංකල්පය ක්‍රියාත්මක වේ. යම් පුද්ගලයකුට තමාගේ නිර්මාණය වෙනුවෙන් ආර්ථික ප්‍රතිලාභයක් ලබාගැනීමට ඉඩ සලසාදීම මෙන්ම නිර්මාණයක් පොදු ජනතාව අතට පත්වීමෙන් පසු නිර්මාණකරුගේ සදාචාර හා ආර්ථික අයිතීන්ට සිදුවන හානිකර තත්ත්වයන්ගෙන් ඔවුන්ව ආරක්ෂාකර දීම රජයක වගකීමකි.

මිනිස් සිතෙහි ඇතිවන යම් අදහසක්, නිර්මාණයක් බවට පත් කිරීමෙන් පසු එය වෙනත් අය පරිහරණය කිරීමෙන් වැළැක්වීමට නිර්මාණකරුවාට හැකියාවක් නැත. බුද්ධිමය දේපළ නීතිය මඟින් බලාපොරොත්තු වනුයේ එකී නිර්මාණ සඳහා ආරක්ෂාව ලබාදීමත්, ඒවා පරිහරණයේදී ප්‍රතිලාභ ලබාගැනීමේ බලය නිර්මාණකරුට හිමි කර දීමත්ය.

බුද්ධිමය දේපළ සංකල්පය ප්‍රධාන කොටස් දෙකකි. එනම් කාර්මික දේපළ හා ප්‍රකාශන අයිතියයි. මෙම ලිපියෙන් සාකච්ඡාවට බඳුන් වනුයේ ප්‍රකාශන අයිතිය හෙවත් ප්‍රකාශන හිමිකම (Copyright) පිළිබඳවයි.

ප්‍රකාශන අයිතිය

විවිධ හේතු මත බුද්ධිමය දේපළට අදාළ නීතිමය රාමුව රටින් රටට වෙනස් විය හැකිය. ලෝක බුද්ධිමය දේපළ සංවිධානය විසින් කළමනාකරණය කරනු ලබන ජාත්‍යන්තර සම්මුතීන් හා ගිවිසුම් විසිහතරකි. ඒ අතර සාහිත්‍යය හා කලාත්මක ක්ෂේත්‍රයට අයත් දැනට පවත්නා ගිවිසුම් හා සම්මුතීන් කිහිපයකි. ශ්‍රී ලංකාව මෙම ගිවිසුම් හා සම්මුතිවල පාර්ශ්වකරුවකු වේ. ඒවා පහත පරිදි වේ.

- බර්න් සම්මුතිය (1886)
- විශ්ව ප්‍රකාශන සම්මුතිය (1952)
- රෝම සම්මුතිය (1961)
- ට්‍රිප්ස් ගිවිසුම (1994)
- ශාබ්දික පටිගත කිරීමේ සම්මුතිය හා චන්ද්‍රිකා සම්මුතිය (1996)
- ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ ප්‍රකාශන අයිතිය පිළිබඳ ගිවිසුම (1996)

සාධාරණ භාවිතය සහ සාධාරණ ගනුදෙනුව

බුද්ධිමය දේපළ නම් පුළුල් නීතිමය සංකල්පයට අනුව ප්‍රකාශන හිමිකම යනු පුද්ගලයෙකු විසින් නිර්මාණය කරන ලද සාහිත්‍යමය, ශාස්ත්‍රීය, කලාත්මක සහ වෙනත් සුදුසු නිර්මාණ සඳහා නීතියෙන් ලබාදෙන අයිතිවාසිකම් සමූහයකි. මෙහි මූලික අරමුණු වන්නේ නිර්මාණකරුවන්ගේ නිර්මාණ ආරක්ෂා කිරීම, එම නිර්මාණ භාවිත කිරීම, ප්‍රතිනිෂ්පාදනය කිරීම හා බෙදාහැරීම සම්බන්ධ අයිතිවාසිකම් නියාමනය කිරීමයි. එහෙත් දැනුම නිර්මාණය කිරීම, අධ්‍යාපනය, පර්යේෂණ, විවේචනය සහ තොරතුරු හුවමාරුව වැනි සමාජීය වශයෙන් වැදගත් කාර්යයන් සඳහා ප්‍රකාශන හිමිකම් සහිත කෘති යම් සීමා යටතේ භාවිත කිරීමට අවස්ථාව සැලසීම ද අවශ්‍ය වේ. මෙම අවශ්‍යතාව සහ නිර්මාණකරුවන්ගේ අයිතිවාසිකම් අතර සමතුලිතතාවක් ඇති කිරීම සඳහා ප්‍රකාශන හිමිකම් නීතිය යටතේ විවිධ ව්‍යතිරේක හා සීමා හඳුන්වා දී ඇත. සාධාරණ ගනුදෙනුව සහ සාධාරණ භාවිතය යනු එවැනි භාවිතයන් සම්බන්ධයෙන් වැදගත් වන නීතිමය සංකල්ප දෙකකි. මෙම සංකල්ප දෙකෙහි මූලික අරමුණ වන්නේ ප්‍රකාශන හිමිකම් හිමිකරුගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන අතරම, දැනුම ලබාගැනීමට, බෙදාහැරීමට සහ නව දැනුම නිර්මාණය කිරීමට අවශ්‍ය අවස්ථා සැලසීමයි. කෙසේ වෙතත්, මෙම සංකල්ප දෙකෙහි නීතිමය ක්‍රියාකාරිත්වය සහ ඒවා අදාළ වන කොන්දේසි එකිනෙකට වෙනස් වේ.

සාධාරණ ගනුදෙනුව යනු, අදාළ රටේ ප්‍රකාශන හිමිකම් නීතියෙන් හඳුනාගත් නිශ්චිත අරමුණු සඳහා නියමිත නීතිමය කොන්දේසි යටතේ ප්‍රකාශන හිමිකම් සහිත කෘතියක් හිමිකරුගේ අවසරය නොමැතිව සාධාරණ ලෙස භාවිත කිරීමට ඉඩ සලසන සංකල්පයකි. එක්සත් රාජධානිය වැනි රටවල මෙම සංකල්පය පර්යේෂණ, පෞද්ගලික අධ්‍යයනය, විවේචනය, සමාලෝචනය සහ උපුටා දැක්වීම වැනි නීතියෙන් පිළිගත්

අරමුණු සමඟ සම්බන්ධ වේ. එහෙත් අදාළ අරමුණකට කෘතියක් භාවිත කළ පමණින් එම භාවිතය සාධාරණ යැයි තීරණය කළ නොහැකිය. භාවිත කරන ප්‍රමාණය, එහි අවශ්‍යතාව, මුල් කෘතියේ වෙළෙඳපොළට ඇති විය හැකි බලපෑම සහ අදාළ නීතියෙන් නියම කර ඇති වෙනත් කොන්දේසිද සලකා බැලිය යුතුය. ඇතැම් අවස්ථාවලදී කෘතියේ මූලාශ්‍රය සහ කර්තෘ පිළිබඳ ප්‍රමාණවත් පිළිගැනීමක් ලබාදීමද අවශ්‍ය වේ. එබැවින් සාධාරණ ගනුදෙනුව යනු ඕනෑම අධ්‍යාපනික හෝ පර්යේෂණ කාර්යයක් සඳහා ප්‍රකාශන හිමිකම් සහිත ද්‍රව්‍ය නිදහසේ භාවිත කිරීමට ලබාදෙන පොදු අවසරයක් නොව, අදාළ නීතියේ සීමාවන්ට යටත් වූ භාවිත අවස්ථාවකි.

සාධාරණ භාවිතය යනු ප්‍රධාන වශයෙන් ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රකාශන හිමිකම් නීතිය යටතේ පිළිගත් සංකල්පයකි. ඇමරිකානු ප්‍රකාශන හිමිකම් පනතේ 107වන වගන්තිය මඟින් විවේචනය, අදහස් දැක්වීම, ප්‍රවෘත්ති වාර්තාකරණය, ඉගැන්වීම, ශාස්ත්‍රීය කටයුතු සහ පර්යේෂණ වැනි අරමුණු සඳහා ප්‍රකාශන හිමිකම් සහිත කෘති සාධාරණ ලෙස භාවිත කිරීම පිළිබඳ නීතිමය පදනම සපයයි. සාධාරණ ගනුදෙනුව සංකල්පය සමඟ සසඳන විට, සාධාරණ භාවිතය යටතේ භාවිතයේ නීත්‍යානුකූලභාවය තීරණය කිරීමේදී නීතියේ සඳහන් අරමුණු පමණක් නොව, අදාළ අවස්ථාවේ තත්ත්වයන් ද සැලකිල්ලට ගනී. මේ සඳහා භාවිතයේ අරමුණ හා ස්වභාවය, භාවිත කරන ලද මුල් කෘතියේ ස්වභාවය, සමස්ත කෘතියට සාපේක්ෂව භාවිත කළ කොටසේ ප්‍රමාණය හා වැදගත්කම සහ එම භාවිතය මුල් කෘතියේ වත්මන් හෝ අනාගත වෙළෙඳපොළට ඇති කළ හැකි බලපෑම යන සාධක හතර සලකා බලනු ලැබේ. මෙම සාධක එකිනෙකින් වෙන්ව නොව, අදාළ සිද්ධියේ සුවිශේෂ කරුණු සමඟ සමස්තයක් ලෙස ඇගයීමට ලක් කෙරේ. ඒ අනුව, වාණිජ නොවන අධ්‍යාපනික භාවිතයක් වීම සාධාරණ භාවිතය සඳහා සහායක කරුණක් විය හැකි නමුත්, එම හේතුව පමණක් මත භාවිතය නීත්‍යානුකූල බව තීරණය කළ නොහැකිය.

සාධාරණ ගනුදෙනුව සහ සාධාරණ භාවිතය අතර ප්‍රධාන වෙනස පවතින්නේ ඒවායේ නීතිමය රාමුව සහ සාධාරණ භාවිතය තීරණය කරන ආකාරය මතය. සාධාරණ ගනුදෙනුව ක්‍රමය යටතේ අදාළ රටේ නීතියෙන් හඳුනාගත් භාවිත අරමුණු සහ ඒවාට අදාළ කොන්දේසි විශේෂ වැදගත්කමක් ගනී. සාධාරණ භාවිතය ක්‍රමය යටතේ, විශේෂයෙන් ඇමරිකානු ප්‍රකාශන හිමිකම් පනතේ 107වන වගන්තිය අනුව, භාවිතයේ අරමුණ ඇතුළු සාධක හතරක් සමස්තයක් ලෙස සලකා බලා එක් එක් සිද්ධියට අදාළ

තීරණයකට එළැඹේ. කෙසේ වෙතත්, සාධාරණ ගනුදෙනුව යනු සෑම අවස්ථාවකදීම දැඩි ලෙස සීමිත ලැයිස්තුවකට පමණක් යටත් වන අතර සාධාරණ භාවිතය යනු සම්පූර්ණයෙන්ම සීමා රහිත ක්‍රමයක් බව සරලව නිගමනය කිරීම සුදුසු නොවේ. රටවල් දෙකෙහිම භාවිතයේ සාධාරණත්වය, ප්‍රමාණවත්භාවය සහ මුල් කෘතියේ අයිතිවාසිකම් කෙරෙහි ඇති බලපෑම වැදගත් වන අතර, අදාළ නීතිමය කොන්දේසි රටින් රටට වෙනස් වේ. එසේම, කෘතියකින් භාවිත කළ හැකි වචන සංඛ්‍යාවක්, පිටු ප්‍රමාණයක් හෝ ප්‍රතිශතයක් සියලු අවස්ථාවලට අදාළ වන පොදු නීතියක් ලෙස හඳුනාගත නොහැකිය.

6. දත්ත විශ්ලේෂණය හා සාකච්ඡාව

6.1. ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ පනත හා ප්‍රකාශන අයිතිය

ශ්‍රී ලංකාවේ පළමු වරට බුද්ධිමය දේපළ පනතක් සම්මත කරනු ලැබුයේ වර්ෂ 1979 දීය. එනම් 1979 අංක 52 දරන බුද්ධිමය දේපළ පනත් සංග්‍රහය වශයෙනි. බුද්ධිමය දේපළ නීතිය පිළිබඳ වඩා වැඩි මහජන අවධානයක් යොමු වී ඇත්තේ 2003 වසරේදීය. එහිදී නව පනතක ආරම්භය සිදු වූ අතර එය 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත ලෙස හඳුන්වනු ලබයි.

ප්‍රකාශන අයිතිය පිළිබඳව 1979 පනත් සංග්‍රහයට වඩා 2003 පනතෙහි සවිස්තරාත්මකව විග්‍රහ කර ඇත. ඒ අනුව 1979 පනත් සංග්‍රහයේ ප්‍රකාශන අයිතිය පිළිබඳව අර්ථ නිරූපණ ඉදිරිපත් කර ඇත්තේ වදන් හා යෙදුම් හතක් වශයෙන් පමණි. එනම්, විකාශනය, ජනප්‍රවාද, රැගුම්, ප්‍රසිද්ධ කරන ලද කෘතීන්, ප්‍රතිනිෂ්පාදනය, පළමුව ප්‍රසිද්ධ කරන ලද කෘතීන්, හවුල් කර්තෘත්ව කෘතිය යනුවෙනි.

වර්ෂ 2003 නව පනත මඟින් ප්‍රකාශන අයිතිය පිළිබඳ වදන් හා යෙදුම් විසිහතරක අර්ථ නිරූපණ ඉදිරිපත් කර ඇත. ඒවා නම්, ශ්‍රව්‍ය දෘශ්‍ය කෘති, කර්තෘ, විකාශනය, සාමූහික කෘති, මහජනයාට සන්නිවේදනය, පරිගණකය, පරිගණක වැඩසටහන, ආර්ථික අයිතිවාසිකම්, ජනප්‍රවාද ප්‍රකාශනය, උල්ලංඝනය, සදාචාර අයිතිවාසිකම්, රංගන ශිල්පීන්, ඡායාරූපගත කෘතිය, නිෂ්පාදකයා, මහජන ප්‍රදර්ශනය, මහජනයාට බැහැරදීම, ප්‍රසිද්ධ රඟ දැක්වීම, පළ කරන ලද, කුලියට දීම, ප්‍රතිනිෂ්පාදනය, ශබ්ද පටිගත කිරීම හෝ තැටිගත කිරීම, කෘතිය, ව්‍යවහාරික කලාකෘති, හවුල් කර්තෘත්ව කෘති යනාදියයි. මීට අමතරව ආරක්ෂිත කෘති, ව්‍යුත්පන්න කෘති, අනාරක්ෂිත කෘති, ආර්ථික අයිතිවාසිකම්, සදාචාර අයිතිවාසිකම්, සාධාරණ භාවිතය, සාධාරණ භාවිතය සිදු කරන ක්‍රියා, ප්‍රකාශන

අයිතිය බලපවත්නා කාලය, ආර්ථික අයිතිවාසිකම්වල මුල් අයිතිය, ආරක්ෂාව පිළිබඳ සීමා යනාදිය සම්බන්ධයෙන්ද කරුණු දක්වා ඇත.

ලෝකයේ බොහෝ රටවල නිර්මාණකරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ප්‍රකාශන අයිතිය හඳුන්වා දී ඇත. සාහිත්‍ය විද්‍යාත්මක හා කලාත්මක නිර්මාණ කුමන ආකාරයෙන් ප්‍රකාශයට පත් කර ඇතත් ඊට ප්‍රකාශන අයිතිය හිමිවීම සඳහා එය සමස්ත නිර්මාණයක් විය යුතුය. එම නිර්මාණයට අදාළ අදහස අලුත් විය යුතු නැත. එහෙත් එය ඉදිරිපත් කර ඇති ආකාරය කර්තෘවරයාගේ නව නිර්මාණයක් විය යුතුය. ප්‍රකාශන අයිතිය ලැබීමේදී නිර්මාණයක ගුණාත්මක වටිනාකම සලකා බලනු නොලබන අතර යම්කිසි නිර්මාණයක් සම්භාව්‍ය ගණයට අයත් වුවත්, දුර්වල කෘතියක් වුවත් ප්‍රකාශන අයිතිය යටතේ එයට නෛතික ආරක්ෂාව සලසා දී ඇත.

6.1.1. ආරක්ෂිත කෘති

මෙරට ප්‍රකාශන අයිතිය පිළිබඳ නීතිය අනුව 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ ප්‍රකාශන අයතිය යටතේ ආරක්ෂිත කෘති දක්වා ඇත. එම කෘතිවල ඒවායේ ප්‍රකාශන ක්‍රමය හෝ ආකාරය මෙන්ම අන්තර්ගතය, ගුණාත්මකභාවය හා කාර්ය ප්‍රමාණය පිළිබඳ නොසලකා හුදෙක් ඒවා නිර්මාණය කරනු ලැබීමේ කාරණය පමණක් සලකා ආරක්ෂා කරනු ලැබේ. ඒ අනුව, ශාස්ත්‍රීය, කලා හා විද්‍යාත්මක පරාසයකට ඇතුළත් පහත සඳහන් මුල් බුද්ධිමය නිර්මාණ, ශාස්ත්‍රීය කලාත්මක හා විද්‍යාත්මක නිර්මාණ වශයෙන් ආරක්ෂා කරනු ලබයි.

අ. පොත්, පත්‍රිකා, ලිපි, පරිගණක වැඩසටහන් හා වෙනත් ලියවිලි

ආ. කථා, දේශන, ඇමතීම්, අනුශාසනා හා වෙනත් ලියවිලි

ඇ. නාටකීය හෝ ගීත නාටකීය කෘති, අභිරූපණ නෘත්‍ය විද්‍යාත්මක කෘති සහ වේදිකා සඳහා වූ නිෂ්පාදන වශයෙන් නිෂ්පාදිත වෙනත් කෘති

ඈ. (ඇ) ඡේදයේ නිශ්චිතව සඳහන් කෘති, වේදිකාගත කිරීම් සඳහා නිෂ්පාදනය කිරීම හා එවැනි නිෂ්පාදන සඳහා යෝග්‍ය ජනප්‍රවාද ප්‍රකාශන වේදිකාගත කිරීම සඳහා නිෂ්පාදනය කිරීම

ඉ. සංගීතය සමඟ ගයන වචන ඇතුළත් හෝ ඇතුළත් නොවන සංගීතමය කෘති

ඊ. ශ්‍රව්‍ය දෘශ්‍ය කෘති

උ. ගෘහ නිර්මාණ ශිල්පීය කෘති

උ. චිත්‍ර, පින්තාරු කිරීම්, මූර්ති, කැටයම්, ලිතෝ මුද්‍රණ, විචිත්‍ර ගෙත්තම්, සහ වෙනත් ලලිත කලාත්මක කෘති

එ. ඡායාරූප ශිල්පීය කෘති

ඒ. ව්‍යවහාරික කලා කෘති

ඔ. භූගෝලීය විද්‍යාව හා භූ ලක්ෂණ විද්‍යාව, ගෘහ නිර්මාණ ශිල්පය හෝ විද්‍යාව සම්බන්ධ සිතියම්, පිඹුරු, කටු සටහන් සහ ත්‍රිමාන කෘති

6.1.2. ව්‍යුත්පන්න කෘති

ව්‍යුත්පන්න කෘති යනුවෙන් අදහස් කරනු ලබන්නේ මුල් කෘතියක් පදනම් කොට නිපදවන වෙනත් කෘති වේ.

උදාහරණයක් වශයෙන් නවකතාවක් ඇසුරෙන් ටෙලි නිර්මාණයක් හෝ සිනමා නිර්මාණයක් කිරීම, මුල් කෘතිය එය ලියැවී ඇති භාෂාවෙන් වෙනත් භාෂාවකට පරිවර්තනය කිරීම.

එසේම මුල් කෘතිය පොදු දේපළක් බවට පත්ව ඇති අවස්ථාවක වුවද ඒ ඇසුරෙන් කරන ලද ව්‍යුත්පන්න කෘතිය මුල් කෘතියක් සේ සලකා නෛතික ආරක්ෂාව සලසනු ලබයි. ඒ අනුව මෙම පනතෙහි පහත දැක්වෙන ව්‍යුත්පන්න කෘති සඳහා ආරක්ෂාව සැලසේ.

අ. කෘතිවල පරිවර්තන, අනුවර්තන, එකලස් කිරීම් හා වෙනත් විපර්යාසයන් හා විකිරණයන්

ආ. අන්තර්ගත කරුණු තෝරා ගැනීම, සම්බන්ධීකරණය හෝ එකලස් කර ඇති ආකාරය හේතුවෙන් මුල් නිර්මාණ බවට පත්වන කෘතීන්හි යාන්ත්‍රිකව කියවනු ලැබිය හැකි හෝ වෙනත් ස්වරූපයක එකතු හා දත්ත එකතු (දත්ත පදනම්)

6.1.3. අනාරක්ෂිත කෘති

මෙම පනත මඟින් ආරක්ෂාව නොලැබෙන කෘති පහත පරිදි වේ.

අ. කෘතියක ප්‍රකාශ කර, විස්තර කර, පැහැදිලි කර, නිරූපණය කර හෝ ගැබ්කර තිබුණද යම් අදහසක්, ක්‍රියාවලියක්, ක්‍රියා පිළිවෙළක්, ක්‍රියා කරවීමේ ක්‍රමයක්, සංකල්පයක්, ප්‍රතිපත්තියක්, නව සොයාගැනීමක් හෝ හුදෙක් දත්ත

ආ. ව්‍යවස්ථාදායක, පරිපාලනමය හෝ නීතිමය ස්වභාවයක වන යම් නිල පාඨ හෝ ඒවායේ නිල පරිවර්තන

ඇ. ප්‍රසිද්ධ කරනු ලබන, විකාශනය කරනු ලබන හෝ වෙනත් යම් ආකාරවලින් පොදුවේ නිවේදනය කරනු ලබන දෛනික ප්‍රවෘත්ති

බුද්ධිමය දේපළ හා පනත ප්‍රකාරව නිර්මාණයක හිමිකරුට ඇති ආර්ථික හා සදාචාරාත්මක අයිතිවාසිකම් පිළිබඳ දක්වා ඇත්තේ පහත පරිදිය.

6.1.4. ආර්ථික අයිතිවාසිකම

11වන වගන්තියේ සිට 13වන වගන්තිය දක්වා වගන්තිවල විධිවිධානවලට යටත්ව, ප්‍රකාශන අයිතිය හිමි වෙනත් තැනත්තාට ඒ කෘතිය සම්බන්ධයෙන් පහත දැක්වෙන ක්‍රියා කිරීමට හෝ ඒ ක්‍රියා කිරීම සඳහා බලය පැවරීමට පරම අයිතිවාසිකමක් තිබිය යුතුය.

අ. කෘතිය ප්‍රතිනිෂ්පාදනය කිරීම

ආ. කෘතිය පරිවර්තනය කිරීම

ඇ. කෘතිය අනුවර්තනය කිරීම, සකස් කිරීම හෝ එහි වෙනත් විපර්යාසයන් සිදු කිරීම

ඈ. විකිණීමෙන්, කුලියට දීමෙන්, අපනයනය කිරීමෙන් හෝ අන්‍යාකාරයෙන් කෘතියේ මුල් පිටපත හෝ එක් එක් අනුපිටපත් මහජනයා අතර බෙදා හැරීම

ඉ. ශ්‍රව්‍ය දෘශ්‍ය කෘතියක, ශාබ්දික පටිගත කිරීමක හෝ තැටිගත කිරීමක ගැබ් වී තිබෙන කෘතියක, පරිගණක වැඩසටහනක, දත්ත පදනමක හෝ ස්වර වැඩසටහනක ස්වරූපයෙන් වූ සංගීත කෘතියක මුල් පිටපත හෝ අනුපිටපතක් එහි මුල් පිටපතේ හෝ අනුපිටපතේ අයිතිය නොසලකා කුලියට දීම.

ඊ. (ආනයනය කළ පිටපත්, ප්‍රකාශන අයිතිය හිමිකරුවකුගේ අවසරය ඇතිව සකස් කර තිබෙන අවස්ථාවක වුවද) කෘතියෙහි පිටපත් ආනයනය කිරීම

උ. කෘතියේ මුල් පිටපතක් හෝ අනුපිටපතක් මහජනයා ප්‍රදර්ශනය කිරීම සඳහා

ඌ. කෘතිය ප්‍රසිද්ධ රඟ දැක්වීම

එ. කෘතිය විකාශනය කිරීම

ඒ. කෘතිය වෙනත් ආකාරයකින් මහජනයා සඳහා සන්නිවේදනය කිරීම

6.1.5. සදාචාරාත්මක අයිතිවාසිකම්

අ. කෘතියේ පිටපත්වල හා ප්‍රායෝගිකව හැකිතාක් දුරට ඔහුගේ කෘතිය පොදු ප්‍රයෝජනය සඳහා ගනු ලැබූ විටක ඔහුගේ නම ප්‍රකටව පෙනෙන පරිදි දක්වනු ලැබීම.

ආ. ඔහුගේ කෘතියක් වශයෙන් ඔහුගේ නම පිටපත්වල හා පොදු ප්‍රයෝජනයක් සඳහා යොදා ගැනීමක් හා සම්බන්ධව සඳහන් කරනු නොලැබීමට හා ආරූඪ නාමයක් පාවිච්චි කිරීමේ අයිතිවාසිකම

ඇ. ඔහුගේ ගරුත්වයට හා කීර්ති නාමයට හානිකර විය හැකි පරිදි ඔහුගේ කෘතිය හා සම්බන්ධ යම් විකෘති කිරීමකට, අංග ඡේදනයකට හෝ විකරණයකට හෝ හීනකාරක ක්‍රියාවකට විරෝධය පෑම

මෙම අධ්‍යයනයට අදාළව සිදු කරන ලද විමර්ශනයට අනුව ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ පනතෙහි ප්‍රකාශන හිමිකම් නීතිය ප්‍රකාරව බුද්ධිමය, ශාස්ත්‍රීය, කලාත්මක හා විද්‍යාත්මක නිර්මාණ අතර ආරක්ෂාව සැලසෙන කෘති, ආරක්ෂාව නොලැබෙන කෘති, ආර්ථික අයිතිවාසිකම් හා සදාචාරාත්මක අයිතිවාසිකම් පිළිබඳ විස්තරාත්මකව දක්වා ඇත. එහිදී එය වැඩිදුර පරිශීලනයෙන් ප්‍රකාශන හිමිකම් නීතියෙහි යම් නිර්මාණයක් සාධාරණ ලෙස භාවිත කළ හැකි ආකාරය පිළිබඳ දක්වා ඇත්තේ පහත ආකාරයෙනි.

6.2. ප්‍රකාශන හිමිකම් නීතියෙහි එන සාධාරණ භාවිතය

9වන වගන්තියේ 1වන උපවගන්තියේ විධිවිධානවලට කුමක් සඳහන්ව තිබුණද විවේචනය, අදහස් දැක්වීම, ප්‍රවෘත්ති වාර්තාකරණය, ඉගැන්වීම (පන්ති කාමරයේ කාර්යය සඳහා වැඩි සංඛ්‍යාවක් පිටපත් සැපයීම ඇතුළුව) ශිෂ්‍යත්ව හෝ පර්යේෂණ කටයුතු සඳහා පිටපත් ප්‍රතිනිෂ්පාදනය හෝ ඒ වගන්තියේ නිශ්චිතව සඳහන් වන යම් ක්‍රමයකින් යම් කෘතියක් සාධාරණ භාවිතය සඳහා ගැනීම, ප්‍රකාශන අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් නොවන්නේය. ඒ අනුව යම් විශේෂිත කාරණයකදී යම් කෘතියකින් ගන්නා භාවිතය සාධාරණ භාවිතයක් ද යන වග නිශ්චය කිරීමේදී පහත දැක්වෙන කරුණු සලකා බැලිය යුතුය.

අ. එම භාවිතය වාණිජ ස්වභාවයක ද යන වග හෝ ලාභ නූපදවන අධ්‍යාපනික කාර්යයක් සඳහාද යන වගද ඇතුළුව එම අරමුණ හා එහි ස්වභාවය

ආ. ප්‍රකාශන අයිතිය සහිත කෘතියේ ස්වභාවය

ඇ. ප්‍රකාශන අයිතිය සහිත සම්පූර්ණ කෘතියට සාපේක්ෂව ප්‍රයෝජනයට ගෙන තිබෙන කොටසේ ප්‍රමාණය හා එහි සාරානුකූලභාවය

ඈ. ප්‍රකාශන අයිතිය සහිත කෘතියේ විභව වෙළඳපළ කෙරෙහි හෝ එහි වටිනාකම කෙරෙහි එකී භාවිතයට ගැනීමෙන් ඇතිවිය හැකි බලපෑම

6.2.1. සාධාරණ භාවිතය සිදු කළ හැකි අවස්ථා

ප්‍රකාශන හිමිකම නීතියට අදාළව යම් නිර්මාණයක් සාධාරණව භාවිතයට ගත හැකි අවස්ථා පහත කරුණු ඔස්සේ පෙන්වා දිය හැකිය.

6.2.1.1. පුද්ගලික භාවිතය සඳහා

පනතෙහි සඳහන් විධිවිධානවලට යටත්ව පළ කරන ලද කෘතියක තනි පිටපතක්, ප්‍රකාශන අයිතිය හිමිකරුවකු විසින් බලය දීමකින් තොරව පෞද්ගලිකව ප්‍රතිනිෂ්පාදනය කිරීමට, එම ප්‍රතිනිෂ්පාදනය කායික පුද්ගලයකු විසින් ඔහුගේ පරම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා නීත්‍යානුකූල පිටපතකින් කරනු ලබන අවස්ථාවක අවසර තිබිය යුතුය. මේ යටතේ අවසරය ඇත්තේ,

අ. ගොඩනැගිල්ලක හෝ වෙනත් ඉදිකිරීමක ස්වභාවයේ වන ගෘහ නිර්මාණ කෘතියක් ප්‍රතිනිෂ්පාදනය

ආ. පොතක හෝ ස්වර සටහන් ස්වභාවයේ වූ සංගීතමය කෘතියක් සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක ප්‍රතිකෘත ශිල්පීය ස්වභාවයේ ප්‍රතිනිෂ්පාදනය

ඇ. දත්ත පදනමක් හෝ ඉන් සැලකිය යුතු කොටසක් ප්‍රතිනිෂ්පාදනය

ඉ. ප්‍රතිනිෂ්පාදනය කිරීමක්, කෘතියක සාමාන්‍ය ප්‍රතිලාභ උත්පාදනය සමඟ ඝට්ටනය වන හෝ කෘතියේ ප්‍රකාශන හිමියන්ගේ නීත්‍යානුකූල සම්බන්ධතාවලට අන්‍යාකාරයෙන් අසාධාරණ ලෙස අගතිදායක විය හැකි අවස්ථාවකදී එය ප්‍රතිනිෂ්පාදනය කෙරෙහි ව්‍යාප්ත නොකළ යුතුය.

කෙසේ වුවද ප්‍රසිද්ධ කළ කෘතියක කෙටි කොටසක්, ප්‍රකාශන අයිතිය හිමිකරුවකු විසින් හෝ අවසර දෙනු ලැබීමකින් තොරව උපුටා දක්වනු ලැබීමට අවසර තිබිය යුතුය.

එසේ වුවද එලෙස අවසරය ඇත්තේ එම ප්‍රතිනිෂ්පාදනය, සාධාරණ ක්‍රියාමාර්ගවලට ගැළපෙන්නේ නම් හා අදාළ කාර්යය අනුව යුක්ති සහගත ප්‍රමාණය ඉක්මවා නොයන්නේ නම් පමණි. එවැනි උපුටා දැක්වීමක් සමඟ එම කෘතියේ ප්‍රභවය හා එම උපුටා ගත් කොටස අයත් කෘතියේ කතුවරයාගේ නම සඳහන් වන්නේ නම්, ඔහුගේ නම ද සඳහන් විය යුතුය.

6.2.1.2. අධ්‍යාපන ආයතනවල ඉගැන්වීමේ කටයුතු සඳහා

පනත ප්‍රකාරව යම් කෘතියක ප්‍රකාශන අයිතිය හිමිකරුවකුගේ බලය දීමකින් තොරව පහත දැක්වෙන ක්‍රියා සඳහා අවසරය තිබිය යුතුය.

අ. ප්‍රසිද්ධ කළ කෘතියක කෙටි කොටසක් නිදර්ශන වශයෙන් හෝ ලියවිලි වශයෙන් හෝ ශබ්ද හෝ දෘශ්‍ය පටිගත කිරීම් හෝ තැටිගත කිරීම් වශයෙන් ඉගැන්වීමේ කටයුතු සඳහා ප්‍රතිනිෂ්පාදනය කිරීම. එසේ වුවද එම ප්‍රතිනිෂ්පාදන සාධාරණ ක්‍රියාමාර්ගවල ගැළපිය යුතු අතර අදාළ කාර්යය අනුව යුක්ති සහගත ප්‍රමාණයන් ඉක්මවා නොයා යුතුය.

ආ. ප්‍රසිද්ධ කළ ලිපි, වෙනත් කෙටි කෘති හෝ කෘතිවල කෙටි උද්ධෘත ප්‍රතිකෘත ශිල්පීය ප්‍රතිනිෂ්පාදන පැවත්වෙන ක්‍රියාකාරකම් සෘජුව හෝ වක්‍රව වාණිජමය ලාභ පිණිස නොවන අධ්‍යාපන ආයතනවල මුහුණට මුහුණලා සිදු කෙරෙන ඉගැන්වීමේ කටයුතු සඳහා තත් කාර්යය අනුව යුක්ති සහගත ප්‍රමාණයට සිදු කරන එම ප්‍රතිනිෂ්පාදන ක්‍රියාව වෙන්කොට සැලකිය හැකි සිද්ධියක් විය යුතු අතර නැවත නැවතත් කරනු ලබන්නේ නම් එය එකිනෙකට වෙනස් හා සම්බන්ධ නොවන අවස්ථාවල විය යුතුය.

එසේ වුවද පිළියෙල කරනු ලබන සෑම පිටපත්වලම ප්‍රායෝගිකව හැකිතාක් දුරට ප්‍රතිනිෂ්පාදිත කෘතියේ ප්‍රභවය හා එහි කර්තෘගේ නම සඳහන් විය යුතුය.

6.2.1.3. අධ්‍යයන හා පර්යේෂණ කටයුතුවල භාවිතය සඳහා

වාණිජමය පරමාර්ථයකින් තොරව කිසියම් පිටපතක් අධ්‍යයනය, ශිෂ්‍යත්වයක් හෝ පෞද්ගලික පර්යේෂණ කටයුතු සඳහාම පමණක් ප්‍රයෝජනයට ගැනීමට අවධානය යොමු කොට ඇත.

ඒ අනුව පර්යේෂණයක් යනු අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ සිදු කරනු ලබන ගැඹුරු අධ්‍යයනයක් වන අතර එහිදී සාහිත්‍ය විමර්ශනයක් ද සිදු කරනු ලබයි. පර්යේෂණයට භාජනය වන ක්ෂේත්‍රය පිළිබඳ පෙර සිදු කරන ලද පර්යේෂණ පරිශීලනය කරමින් තමාගේ පර්යේෂණයට ද යොදා ගනී. එලෙස ලබා ගත් බව උද්ධෘත සහිතව කර්තෘගේ නම සඳහන් කරමින් යොදා ගත හැකිය.

6.2.1.4. කාලීන සිදුවීම් වාර්තාකරණය සඳහා

ප්‍රකාශන අයිතිය හිමිකරුවකු විසින් බලය දීමකින් තොරව හා ප්‍රායෝගිකව හැකිතාක් දුරට කෘතියේ ප්‍රභවය හා කර්තෘගේ නම සඳහන් කිරීමේ බැඳීමට යටත්ව යොදා ගත හැකිය.

අ. කාලීන, ආර්ථික, දේශපාලනික හෝ ආගමික මාතෘකාවක් මත පුවත්පතක හෝ වාර ප්‍රකාශනයක පළ කරන ලද ලිපියක්, විකාශනය කිරීමෙන් හෝ වෙනත් සන්නිවේදන ක්‍රමයකින් මහජනයා වෙත ඉදිරිපත් කිරීම, පුවත්පතක හෝ වාර ප්‍රකාශනයක ප්‍රතිනිෂ්පාදනය කිරීම හෝ ඒ ආකාරයේම වූ විකාශනය කළ සන්නිවේදනයකට අදාළ වන්නා වූ කෘතියක් ප්‍රතිනිෂ්පාදනය කිරීම, තවද එම ප්‍රතිනිෂ්පාදනය කිරීම, විකාශනය කිරීම හෝ මහජනයා වෙත වෙනත් ආකාරයකින් සන්නිවේදනය කිරීම, එහි ප්‍රකාශන අයිතිය හිමිකරු විසින් එම පිටපත් මත ප්‍රකාශිතව රඳවා තබා ගෙන ඇති හෝ එම කෘතිය විකාශනය කිරීම හෝ වෙනත් ආකාරයකින් මහජනයා වෙත සන්නිවේදනය කිරීම රඳවා තබා ගෙන ඇති අවස්ථාවකට එම අවසරය අදාළ නොවිය යුතුය.

ආ. කාලීන සිද්ධි වාර්තා කිරීමේ කාර්යය සඳහා ඒ සිද්ධිය වාර්තා කිරීමේ යෙදී සිටියදී දකින්නට හෝ අසන්නට ලැබුණු කෘතියකින් උපුටා ගත් කෙටි කොටස්, අදාළ කාර්යය අනුව සාධාරණය වන ප්‍රමාණයට ප්‍රතිනිෂ්පාදනය කිරීම සහ මහජනයා වෙත විකාශනය කිරීම හෝ වෙනත් ආකාරයකින් සන්නිවේදනය කිරීම.

ඇ. දේශපාලන කතාවක්, දේශනයක්, ඇමතීමක්, අනුශාසනාවක් හෝ ප්‍රසිද්ධියේ කරනු ලබන ඒ හා සමාන ස්වභාවයේ වෙනත් කෘතියක් හෝ නඩු කටයුත්තකදී කරන ලද දේශනයක්, කාලීන තොරතුරු සැපයීමේ කාර්යය සඳහා සාධාරණය වන තාක් දුරට පුවත්පතක හෝ වාර ප්‍රකාශනයක ප්‍රතිනිෂ්පාදනය කිරීම, මහජනයා වෙත විකාශනය කිරීම හෝ වෙනත් ආකාරයකින් සන්නිවේදනය කිරීම.

6.2.1.5. පුස්තකාලය හා ලේඛනාගාරවල භාවිතය සඳහා

ඍජුවම හෝ වක්‍රව වාණිජමය ප්‍රතිලාභයක් සඳහා නොවන යම් පුස්තකාලයක් හෝ ලේඛනාගාරයක් විසින් කෘතියක හෝ ප්‍රකාශන අයිතිය හිමිකරුගේ බලය දීමකින් තොරව එම කෘතියක එක පිටපතක්,

අ. එම ප්‍රතිනිෂ්පාදිත කෘතිය ප්‍රසිද්ධ කළ ලිපියක, වෙනත් කෙටි කෘතියක හෝ කෘතියක කෙටි උද්ධෘතයක් වන්නා වූ සහ එම ප්‍රතිනිෂ්පාදනයේ අරමුණ කායික පුද්ගලයකුගේ ඉල්ලීම සපුරාලීම වන්නා වූ අවස්ථාවක,

I. එම පිටපත අධ්‍යයනය, ශිෂ්‍යත්වයක් හෝ පෞද්ගලික පර්යේෂණ කටයුතු සඳහාම පමණක් ප්‍රයෝජනයට ගන්නා බවට එම පුස්තකාලය හෝ ලේඛනාගාරය සෑහීමකට පත් වන්නේ නම්,

II. එම නිෂ්පාදන ක්‍රියාව වෙන් කොට හඳුනා ගත හැකි සිදුවීමක් වන්නේ නම් හා නැවතත් සිදු කෙරුණහොත් එය එකිනෙකට වෙනස් වූ සහ සම්බන්ධයක් නොමැති අවස්ථාවල සිදු කරන්නේ නම්.

(ආ). එම පිටපත ගනු ලබන්නේ සංරක්ෂණය පිණිස වන හා අවශ්‍ය වුවහොත් පිටපතක් ප්‍රතියෝජනය කිරීම පිණිස හෝ වෙනත් ඒ හා සමාන පුස්තකලයක හෝ ලේඛනාගාරයක නිත්‍ය එකතුවකින් නැති වූ විනාශ වූ හෝ පාවිච්චියට ගත නොහැකි පිටපතක් ප්‍රතියෝජනය කිරීම සඳහා වන අවස්ථාවක,

එසේම එවැනි පිටපතක් සාමාන්‍ය සාධාරණ තත්ත්වයක් යටතේ ලබාගත නොහැකි නම් සහ එසේම තවදුරටත් වෙනස් කොට සැලකිය හැකි සිදුවීමක් වන්නේ නම් එය නැවත නැවතත් කරනු ලබන අවස්ථාවක එය කරනු ලබන්නේ එකිනෙකට වෙනස් සහ සම්බන්ධයක් නොමැති අවස්ථාවකදී නම් ප්‍රතිකෘත ශිල්පීය ප්‍රතිනිෂ්පාදනයක් වශයෙන් ලබාගත හැකිය.

උක්ත දැක්වූ විවිධ අවස්ථාවන් අනුව යම් යම් ආකාරයෙන් කිසියම් නිර්මාණයක් සාධාරණ අයුරින් භාවිත කිරීමට මෙම පනතින් අවසරය ලබා දී ඇත. එසේ තිබියදීත් ප්‍රකාශන අයිතිය උල්ලංඝනය කරමින් නිර්මාණ කොල්ලය සිදු වන අවස්ථා වර්තමානයේ බහුලව දැකගත හැකිය.

6.3. නිර්මාණ කොල්ලය

කිසියම් නිර්මාණයක නිර්මාතෘවරයාගේ අවසරය ලබා ගත යුතුව තිබියදී එසේ ලබා නොගෙන අනවසරයෙන් එම නිර්මාණය පරිහරණය කිරීමෙන් එම නිර්මාණයේ හිමිකරුවාගේ ප්‍රකාශන අයිතිය උල්ලංඝනය වේ. ප්‍රකාශන අයිතිය මඟින් ආරක්ෂිත කෘතියක් එහි හිමිකරුගෙන් අවසරය නොලබා වාණිජ පරමාර්ථයෙන් භාවිත කිරීම නිර්මාණ කොල්ලය නමින් හැඳින්වේ.

නූතන තාක්ෂණයේ දියුණුව හේතුවෙන් වර්තමානයේ නිර්මාණ කොල්ලය බහුලව සිදුවනු දැකිය හැකිය. එපමණක් නොව මුද්‍රිත මාධ්‍යයෙන් ඔබ්බට ගොස් ශ්‍රව්‍ය දෘශ්‍ය ස්වරූපයේ මාධ්‍යවල පැමිණීම ඊට හේතු වී ඇත. ඒ අනුව,

- ඩිජිටල් තාක්ෂණය ශීඝ්‍රයෙන් පැතිරයාම.
- මුද්‍රණ ක්ෂේත්‍රයේ සමතල මුද්‍රණය ඡායා පිටපත් යන්ත්‍ර හා ඩුප්ලෝ ක්‍රමය දක්වා මුද්‍රණ තාක්ෂණයේ දියුණුව.

- සංගෘහිත තැටි සහ දක්වා තාක්ෂණික මෙවලම් බහුලවීම.
- වීඩියෝ උපකරණ මඟින් ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණයක් පහසුවෙන් පිටපත් කර ගැනීමේ හැකියාව.
- පිටපත් කිරීමේ හා ප්‍රතිනිෂ්පාදන යන්ත්‍ර වෙළඳපළෙහි තුල බහුලවීම.
- අන්තර්ජාලය යොදා ගනිමින් ඕනෑම නිර්මාණයක් වෙනත් ස්ථානයකට යැවීමට ඇති පහසුව.

වැනි අවස්ථාවන් නිසා අද වන විට නිර්මාණ කොල්ලය නිදහසේ සිදු වනු දැකගත හැකිය.
නිර්මාණ කොල්ලය හේතුවෙන් හානි සිදුවන පාර්ශ්වයන් බොහොමයකි. කර්තෘවරුන්, රංගන ශිල්පින්, ප්‍රකාශයන්, නිෂ්පාදකයන් ඇතුළු සෑම නිර්මාණ හිමිකරුවෙකුටම ඉන් අසාධාරණයක් සිදු වේ. මෙහිදී දක්නට ලැබෙන ප්‍රධානතම ලක්ෂණය වනුයේ වාණිජ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අනවසරයෙන් නිර්මාණ යොදා ගැනීමයි.

6.4. පුස්තකාලවලය කාර්යභාරය

පාඨක තොරතුරු අවශ්‍යතා ඉටු කිරීමේ කාර්යයයේදී පුස්තකාලයක කාර්යභාරය සුළු පටු නොවේ. තොරතුරු මූලාශ්‍ර අත්පත් කර ගැනීම, පාඨකයාට පහසුවෙන් තොරුතුරු ලබාගත හැකි ලෙස සංවිධානය කිරීමෙන් ඔබ්බට ගොස් පාඨකයා වෙත තොරතුරු සේවා ලබා දීමෙහි ලා විශාල මෙහෙවරක් සිදු වේ. මන්ද සීමිත සම්පත් ප්‍රමාණයකින් අසීමිත පාඨක අවශ්‍යතා ඉටු කිරීමට සිදුවීමයි.

ලෝකයේ ඇතැම් රටවල පොදු බැහැරදීමේ අයිතිය පිළිබඳ පනත් ක්‍රියාත්මක වේ. මහජන පුස්තකාලය, පළාත් පාලන ආයතනවලින් පවත්වාගෙන යන පුස්තකාලය වැනි පොදු පුස්තකාලයවල බැහැරදෙන අංශයෙන් පාඨකයෝ නොමිලයේම පොත් පරිහරණය කරති. මේ හේතුවෙන් පොත්වල කර්තෘවරු කිසිදු ප්‍රතිලාභයක් නොලබති. කර්තෘවරුන් මේ නිසා ලබන පාඩුව ප්‍රතිපූර්ණය කළ යුතු බව දක්වමින් මෙවැනි පනතක් ක්‍රියාත්මක වී ඇත. ඒ අනුව ඩෙන්මාර්කය, ඕස්ට්‍රලියාව, පින්ලන්තය, නෙදර්ලන්තය, නවසීලන්තය, බ්‍රිතාන්‍ය වැනි රටවල මෙම පනත ක්‍රියාත්මක කර ඇත.

Adam (2025) පෙන්වා දෙන්නේ ප්‍රකාශන හිමිකම් පිළිබඳ විශේෂඥයන් වීම පුස්තකාලයීය වෘත්තිකයන්ගේ අනිවාර්ය කාර්යභාරය නොවුණද, ප්‍රකාශන හිමිකම් සහ සාධාරණ භාවිතය පිළිබඳ විශ්වාසදායක තොරතුරු සොයාගත හැකි මූලාශ්‍රය පිළිබඳ

දැනුම ඔවුන් සතු වීම වැදගත් බවයි. සිසුන්, ආචාර්යවරුන් සහ අනෙකුත් පුස්තකාලය පරිශීලකයන්ට ප්‍රකාශන හිමිකම් සහිත කෘති භාවිත කළ හැකි ආකාරය පිළිබඳ ගැටලු මතුවන විට, අදාළ නීතිමය හා තොරතුරු සම්පත් වෙත ඔවුන් යොමු කිරීමෙන් පුස්තකාලයීය වෘත්තිකයන්ට සහාය විය හැකිය. උදාහරණයක් ලෙස, පාඨමාලා සඳහා අධ්‍යයන ද්‍රව්‍ය සකස් කිරීමේදී ප්‍රකාශන හිමිකම් සහිත කෘතිවලින් කොටස් භාවිත කිරීමේ හැකියාව පිළිබඳ මඟපෙන්වීමක් ලබාදීම එවැනි කාර්යයකි. එහෙත්, පුස්තකාලයීය වෘත්තිකයන් නීතිඥයන් හෝ නීති උපදේශකයන් නොවන බැවින් ඔවුන්ගේ කාර්යභාරය විය යුත්තේ නීතිමය තීරණ ලබාදීම වෙනුවට පරිශීලකයන්ට විශ්වාසදායක තොරතුරු සහ මෙවලම් සපයා දැනුවත් තීරණ ගැනීමට සහාය වීමයි.

තවද, ප්‍රකාශන හිමිකම් සහිත කෘති භාවිත කිරීමේදී සාධාරණ භාවිතය සහ නිර්මාණ කොල්ලය අතර වෙනස හඳුනාගැනීමද වැදගත් වේ. සාධාරණ භාවිතය යනු අදාළ නීතිමය රාමුව යටතේ ඇතැම් භාවිතයන්ට ඉඩ සැලසීම සම්බන්ධ සංකල්පයක් වන අතර, නිර්මාණ කොල්ලය යනු වෙනත් පුද්ගලයකුගේ අදහස්, වචන හෝ නිර්මාණ නිසි පිළිගැනීමක් හෝ මූලාශ්‍රය සඳහනක් නොමැතිව තමන්ගේ නිර්මාණයක් ලෙස ඉදිරිපත් කිරීම හා සම්බන්ධ ශාස්ත්‍රීය හා සදාචාරාත්මක ගැටලුවකි. එබැවින්, ප්‍රකාශන හිමිකම් නීතිය යටතේ යම් භාවිතයක් අවසර ලත් එකක් වුවද, එය ශාස්ත්‍රීය කටයුතුවලදී නිසි මූලාශය සඳහන් කිරීමේ අවශ්‍යතාවයෙන් පරිශීලකයා නිදහස් නොකරයි. එසේම, මූලාශ්‍රය නිවැරදිව සඳහන් කිරීම පමණක් ප්‍රකාශන හිමිකම් උල්ලංඝනයක් සිදු නොවන බවට සහතිකයක් නොවේ.

ඩිජිටල් තොරතුරු මූලාශ්‍ර සහ නව තාක්ෂණික මෙවලම් ව්‍යාප්ත වීමත් සමඟ ප්‍රකාශන හිමිකම් සහිත අන්තර්ගතය පිටපත් කිරීම, බෙදාහැරීම සහ අධ්‍යයන කටයුතු සඳහා යොදාගැනීම වඩාත් පහසු වී ඇත. එමඟින් තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අවස්ථා පුළුල් වුවද, එම තොරතුරු නීත්‍යානුකූලව සහ සදාචාරාත්මකව භාවිත කිරීම පිළිබඳ අවධානය ද වැඩි වී තිබේ. මේ සම්බන්ධයෙන්, Adamsගේ පර්යේෂණය මඟින් ප්‍රකාශන හිමිකම් සහ සාධාරණ භාවිතය පිළිබඳ ලිඛිත සම්පත්, වීඩියෝ සහ මාර්ගගත මෙවලම්වල ප්‍රයෝජනවත්භාවයද පෙන්වා දෙයි. විශේෂයෙන්ම, විවෘත අධ්‍යාපනික සම්පත් (Open Educational Resources—OER) භාවිතයේදී අදාළ බලපත්‍ර සහ භාවිත කොන්දේසි පිළිබඳ අවබෝධය වැදගත් වේ.

සමස්තයක් ලෙස Adamsගේ ලිපිය මඟින් ප්‍රකාශන හිමිකම් සහ සාධාරණ භාවිතය පිළිබඳ දැනුම පුස්තකාලය සේවා සැපයීමේදී සහ පරිශීලකයන්ට මඟපෙන්වීමේදී

වැදගත් වන බව පැහැදිලි වේ. මෙම අදහස් ශ්‍රී ලංකාවේ පුස්තකාලය හා ශාස්ත්‍රීය පරිසරය තුළ ද අදාළ කරුණු විමර්ශනය කිරීමට පදනමක් සපයයි. කෙසේ වෙතත්, ලිපිය ප්‍රධාන වශයෙන් ඇමරිකානු සාධාරණ භාවිතය පිළිබඳ සංකල්පය මත පදනම් වන බැවින්, ශ්‍රී ලංකාවේ නීතිමය තත්ත්වය විශ්ලේෂණය කිරීමේදී බුද්ධිමය දේපළ පනතේ අදාළ ප්‍රතිපාදන වෙනම සලකා බැලිය යුතුය.

McCormick (2014) විසින් රචිත Copyright, Fair Use and the Digital Age in Academic Libraries: A Review of the Literature. යන ලිපිය ඇමරිකා එක්සත් ජනපදයේ විශ්වවිද්‍යාලය හා අධ්‍යයන පුස්තකාලය පරිසරය තුළ ප්‍රකාශන හිමිකම් නීතිය සහ සාධාරණ භාවිතය පිළිබඳ සංකල්පය සම්බන්ධයෙන් පවතින සාහිත්‍යය විමර්ශනය කරයි. විශේෂයෙන්ම, මුද්‍රිත තොරතුරු සම්පත් ඩිජිටල් සම්පත් බවට පරිවර්තනය වීමත් සමඟ ප්‍රකාශන හිමිකම් ආරක්ෂාව සහ තොරතුරු වෙත ප්‍රවේශවීම අතර ඇතිවන ගැටලු පිළිබඳව මෙහි අවධානය යොමු කර ඇත.

එක්සත් ජනපදයේ සාධාරණ භාවිතය මූලධර්මය යටතේ, ප්‍රකාශන හිමිකම් සහිත කෘතියක් භාවිත කිරීම සාධාරණද යන්න තීරණය කිරීමේදී භාවිතයේ අරමුණ හා ස්වභාවය, කෘතියේ ස්වභාවය, භාවිත කරන කොටසේ ප්‍රමාණය හා වැදගත්කම සහ එම භාවිතය කෘතියේ වෙළෙඳපොළ වටිනාකමට ඇති කරන බලපෑම යන කරුණු සලකා බලන බව කතුවරයා පෙන්වා දෙයි. එහෙත්, මෙම කරුණු අදාළ කරගැනීමේදී අවිනිශ්චිතතා ඇති විය හැකි බැවින් සාධාරණ භාවිතය සම්බන්ධ තීරණ ගැනීම සැමවිටම සරල ක්‍රියාවලියක් නොවන බවද ලිපියෙන් පැහැදිලි වේ.

තවද, අධ්‍යයන පුස්තකාලයවල පාඨමාලා සඳහා අතිරේක කියවීම් ද්‍රව්‍ය සකස් කිරීම, ආයතනික තැන්පතු (Institutional Repositories) සංවර්ධනය කිරීම, ඩිජිටල් එකතු කළමනාකරණය සහ ප්‍රකාශන හිමිකම් පිළිබඳ දැනුවත් කිරීම වැනි කාර්යයන්හිදී ප්‍රකාශන හිමිකම් සම්බන්ධ ගැටලු මතුවිය හැකි බව McCormick සාකච්ඡා කරයි. එසේම, ආචාර්යවරුන්, ශිෂ්‍යයන් සහ පුස්තකාලයීය කාර්ය මණ්ඩලය අතර ප්‍රකාශන හිමිකම් පිළිබඳ දැනුම වර්ධනය කිරීම සඳහා අඛණ්ඩ අධ්‍යාපනය හා පුහුණුව අවශ්‍ය බවද අවධාරණය කරයි.

උක්ත අධ්‍යයනය වර්තමාන පර්යේෂණයට අදාළ වන්නේ ප්‍රකාශන හිමිකම් නීතිය, අධ්‍යයන කටයුතු සඳහා තොරතුරු භාවිතය සහ පුස්තකාලයවල වගකීම් අතර පවතින සම්බන්ධතාව පැහැදිලි කරන බැවිනි. විශේෂයෙන්ම, අධ්‍යාපනික හා පර්යේෂණ

කටයුතුවලදී කෘති භාවිත කිරීමේ නීතිමය සීමා පිළිබඳ අවබෝධයක් තිබීමේ වැදගත්කම එමඟින් හඳුනාගත හැකිය. කෙසේවෙතත්, මෙම ලිපිය ඇමරිකානු ප්‍රකාශන හිමිකම් නීතිය සහ එරට අධ්‍යයන පුස්තකාලය පරිසරය පදනම් කරගෙන සකස් කර ඇති බැවින්, එහි සාධාරණ භාවිතය සම්බන්ධ නීතිමය කරුණු ශ්‍රී ලංකාවේ නීතියට ඍජුවම අදාළ කරගත නොහැකිය. ඒ වෙනුවට, ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ නීතිය යටතේ අදාළ වන විධිවිධාන සලකා බැලිය යුතුය.

පාඨකයාට යම් නිර්මාණයක් භාවිත කළ යුතු ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීම පුස්තකාලය මඟින් සිදුවිය යුතුය. ඉන් අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

- පුස්තකාලය සාමාජිකත්වය ලබා ගන්නා නව පාඨකයන්ට පුස්තකාලයේ ඇති තොරතුරු මූලාශ්‍රය පරිහරණය කළ යුතු ආකාරය පිළිබඳ පාඨක අධ්‍යාපනික වැඩසටහන් මඟින් දැනුම්වත් කිරීම.
- ඡායාපිටපත් සේවා ලබා ගැනීමේදී එහි සීමාවන් පිළිබඳ පාඨකයන් දැනුවත් කිරීම.
- යම් ලෙසකින් පාඨකයන් එම සීමාවන් ඉක්මවා ඡායාපිටපත්කරණයේ යෙදීම වළක්වාලීම සඳහා එම ඡායාපිටපත් අංශයේ තුල රාජකාරී කරන කාර්ය මණ්ඩලය දැනුම්වත් කිරීම.
- ප්‍රකාශන හිමිකම්වල දක්වා ඇති සාධාරණ භාවිතයන් පිළිබඳ උද්ධෘත පුස්තකාලය තුළ ප්‍රදර්ශනය කර තැබීමෙන් යම් නිර්මාණයක් භාවිත කිරීමේ සීමා පිළිබඳ පාඨකයාට ඒත්තු ගැන්වීම.
- යම් නිර්මාණයකින් ලබා ගන්නා තොරතුරක් තම අවශ්‍යතාවයන් සඳහා භාවිත කරන අවස්ථාවලදී කර්තෘගේ නම් සඳහන්ව උපුටා දැක්විය යුතු ආකාරය පිළිබඳ තොරතුරු සාක්ෂරතා පාඨමාලාවල සිදු කිරීම.

7. නිගමනය

බුද්ධිමය දේපළ පනතෙහි ප්‍රකාශන හිමිකම් නීතියට අදාළව අධ්‍යයන හා පර්යේෂණ උදෙසා සාධාරණ ලෙස භාවිතයට ඉඩ ප්‍රස්තාව ලබා දුන්නද ඇතැම් අවස්ථාවලදී එම සීමා ඉක්මවා යන අවස්ථාද නැතුවා නොවේ. ඊට විවිධ හේතු පෙන්වා දිය හැකිය.

- පාඨක අවශ්‍යතා සඳහා පුස්තකාලය තුළ ඡායා පිටපත් ලබා ගැනීමේ පහසුකම සලසා ඇති මුත් ඇතැම් විට සම්පූර්ණ කෘතියම ඡායා පිටපත් ලෙස ලබා ගැනීම වළක්වාලිය නොහැක. පුස්තකාලය තුළ ඒ සඳහා නීති සකසා තිබුණද එම සීමාවන් නොසලකා ඇතැම් පාඨකයන් මෙම ක්‍රියාව සිදු කරයි.

- වර්තමානයේ බොහෝ කෘතිවල ග්‍රන්ථ නාම පිටුවට පසු පිටුවේ කර්තෘගේ/ප්‍රකාශකයන්ගේ නිසි අවසරයකින් තොරව ග්‍රන්ථය සම්පූර්ණයෙන්ම හෝ කොටසක් හෝ උපුටා ගැනීම, පිටපත් කිරීම, පළ කිරීම, අනුවර්තනය කිරීම තහනම් බව දක්වා තිබුණත් ඇතැම් අවස්ථාවල එය නොසලකා හරිමින් කටයුතු කරනු දැකිය හැකිය.

- වර්තමානයේ ඡායාපිටපත් යන්ත්‍රයක, ස්කෑන් යන්ත්‍රයක කාර්යභාරය සුහුරු ජංගම දුරකථනයට සිදු කිරීමට ඇති හැකියාව නිසාම ඇතැම් නීති උල්ලංඝනය කරමින් පිටපත්කරණය සිදු කරනු දැකිය හැකිය.

- ඩිජිටල් තාක්ෂණයේ මහිමය නිසාම මෙලෙස පිටපත් කර ගන්නා දෑ තත්පර ගණනකින් තවත් විශාල පිරිසක් වෙත එකවර හුවමාරු කර ගැනීමද වර්තමානයේ බහුලව සිදු වන බරපතල කාරණාවකි.

- යම් නිර්මාණයක් එය භාවිත කළ යුත්තේ කෙසේද යන්න පිළිබඳ අවබෝධය අප සමාජයේ දැනුවත්ව තිබෙනුයේ අල්ප වශයෙනි. එසේ සිදුකිරීමෙහි ඇති වරද හා පනවා ඇති නීතිරීති, දඬුවම් පිළිබඳ ජනතාව දැනුම්වත් කිරීමට සුදුසු පියවර යෙදීම කඩිනම් නොවුණහොත් නිර්මාණ අවභාවිතයත්, නිර්මාණකරුවන් වැඩි වශයෙන් අපහසුතාවට ලක්වීමත් වළක්වාලිය නොහැකිවීම.

8. සමාලෝචනය

ඉතිහාසය පුරාවට බුද්ධිමය දේපළ හා දැනුම සාධාරණ භාවිතය පිළිබඳ ලොව පුරා රටවල අවධානය යොමු කොට තිබේ. කඩදාසි තාක්ෂණය පමණක් පැවති මුල් අවධියේදී එය එතරම් සංකීර්ණ බවක් දක්නට නොපැවතුණි. මුල් කාලීනව නීති සම්පාදකයන්ගේ අවධානය යොමු වූයේ ප්‍රකාශන හිමිකම දරන්නාගේ ආර්ථික අයිතිවාසිකම ලබාදීමටයි. පසුකාලීනව එහි ආර්ථික හා සදාචාරාත්මක අයිතිවාසිකම් පිළිබඳ අවධානය යොමු විය.

නූතන ඩිජිටල් තාක්ෂණයේ ශීඝ්‍ර වර්ධනය බුද්ධිමය දේපළ නීතියට අයත් සාධාරණ භාවිතය යන සංකල්පය දැඩි අභියෝගයට ලක්ව ඇත. බුද්ධිමය දේපළ හිමිකරුවාගේ අවසරයකින් තොරව අධ්‍යයන, පර්යේෂණ හෝ ප්‍රවෘත්ති වාර්තාකරණය වැනි අවස්ථාවලදී නීත්‍යානුකූලව අවසර ලබා දී ඇති අවස්ථා සඳහා භාවිත කිරීමේ ගැටලුවක් නොමැති වුවද නූතන සමාජ ජාලා මාධ්‍ය ඇතුළු ඩිජිටල් මෙවලම් ඔස්සේ සාධාරණ භාවිතයකින් තොරව එනම් අසාධාරණ ලෙස බුද්ධිමය දේපළ පැහැර ගන්නා අයුරු වර්තමානයේ බහුලව දක්නට ලැබේ. යම් ලේඛනයක්, ඡායාරූපයක්, වීඩියෝ පටයක් ආදී ඕනෑම නිර්මාණයක් ඉතාම කෙටි කාලයකින් පුද්ගලයෙක්, කණ්ඩායමක් හෝ සමූහයක් අතර බෙදා ගැනීමට හෝ හුවමාරු කරගැනීම වර්තමානයේ බහුලව සිදුවනු දැකිය හැකි කරුණකි. නූතන තාක්ෂණික අවකාශය තුළ සිදුවන මෙම බුද්ධිමය දේපළ සොරකම් වළක්වා ගැනීම සඳහාත්, නවීන තාක්ෂණ විපර්යාසය සමඟ සාධාරණ ලෙස භාවිතයට යොදාගත හැකි වන අයුරින් මෙන්ම සියලු පාර්ශවයන්ට සාධාරණය ඉටුවන ආකාරයට අනාගතයේ මේ පිළිබඳ නීති සම්පාදනය කිරීමට වග බලා ගත යුතුය.

පරිශීලන නාමාවලිය

බොතේජු, බී. ජී. (2013). *ප්‍රකාශන අයිතිය සම්බන්ධිත අයිතිවාසිකම්: භාවිතය, ගැටලු සහ අභියෝග.* සරසවි.

බොතේජු, බී. ජී. (2005). *ප්‍රකාශන අයිතිය සහ සම්බන්ධිත අයිතිවාසිකම් පිළිබඳ මූලික සංකල්ප.* ගොඩගේ.

ද සිල්වා, ටී. (2005). *බුද්ධිමය දේපල හා ප්‍රකාශන අයිතිය.* ගොඩගේ.

නවරත්න, ඩබ්. (2010). *බුද්ධිමය දේපල නීතිය.* ආකර්ෂා.

ශ්‍රී ලංකාව. බුද්ධිමය දේපල පනත (2003). *2003 අංක 36 දරණ බුද්ධිමය දේපල පනත.* රජයේ ප්‍රකාශන කාර්යාංශය.

ශ්‍රී ලංකාව. බුද්ධිමය දේපල පනත (1979). *1979 අංක 52 දරණ බුද්ධිමය දේපල නීති සංග්‍රහ පනත.* රජයේ ප්‍රකාශන කාර්යාංශය.

Adams, A. L. (2025). Fair use and copyright resources. *Public Services Quarterly*, *21*(1),37–44. https://doi.org/10.1080/15228959.2024.2440364

Cabral, H. (2004). *Intellectual property law in Sri Lanka*. Author.

Chadha, P., & Shukla, P. (2025). Fair use in the digital era: Balancing creativity and copyright protection. In H. Rahman (Ed.), *Digital citizenship and building a responsible online presence* (pp. 209–240). IGI Global. doi.org.

Karunaratna, D.M. (2006). *An introduction to the law of copyrights in Sri Lanka.* Vishwalekha,

McCormick, A. (2014). Copyright, Fair Use and the Digital Age in Academic Libraries: A Review of the Literature. School of Information Student Research Journal, 4(2). https://doi.org/10.31979/2575-2499.040205 Retrieved from https://scholarworks.sjsu.edu/ischoolsrj/vol4/iss2/5

UK Intellectual Property Office. (2021). *Exceptions to copyright*. https://www.gov.uk/guidance/exceptions-to-copyright

United States Copyright Office. (n.d.). *Fair Use Index*. https://copyright.gov/fair-use/

United States Code, Title 17, Section 107. *Limitations on exclusive rights: Fair use.* https://www.govinfo.gov/content/pkg/USCODE-2024-title17/html/USCODE-2024-title17-chap1-sec107. html